(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 44.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2010 නොවැම්බර් මස 09 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0119/'10

1\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2005 සිට 2010 මාර්තු 31 දක්වා ශ්‍රී ලංකාවට ගෙන්වන ලද සේලයින්,

(i) ප්‍රමාණය කොපමණද;

(ii) වර්ග කවරේද;

(iii) ආනයනය කිරීමට වැයවූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය දිනවල සේලයින් හිඟයක් පිළිබඳව විවිධ තොරතුරු පුවත්පත්වල පළවූ අතර එවැනි තත්ත්වයක් ඇතිවීමට හේතු කවරේද;

(ii) එවැනි තත්ත්වයක් ඇති කිරීමට නිලධාරියෙකු සම්බන්ධ නම්, ඔවුන්ට එරෙහිව ගත් පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0260/'10

2\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් බෙලිඅත්ත කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0273/'10

3.

ගරු රාජීව විජේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන සහ ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) "ඉන්ටර්නැෂනල් ක්‍රයිසීස් ගෲප්" නමැති සංවිධානයක් පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම සංවිධානයේ නියෝජිතයින් දැනට ශ්‍රී ලංකාව තුළ සිටිත් ද, එසේත් නැති නම්, පසු ගිය වර්ෂ 10ක කාලය තුළ සිටියෝ ද;

(ii) එම සංවිධානය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූයේ කවර විධිවිධාන යටතේද;

(iii) එහි ජාත්‍යන්තර ක්‍රියාකාරිකයින් සඳහා වීසා බලපත් ලබා දුන්නේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම සංවිධානය විසින් ශ්‍රී ලංකාව තුළ සේවයේ යොදවනු ලැබූ ශ්‍රී ලාංකිකයින්ගේ නම් කවරේද;

(ii) ඔවුන් සතු අධ්‍යාපනික හෝ වෙනත් සුදුසුකම් කවරේද;

(iii) "ඉන්ටර්නැෂනල් ක්‍රයිසීස් ගෲප්" සංවිධානය විසින් ඒ එක් එක් තැනැත්තාට ගෙවන ලද මුදල සහ ඒවා ගෙවූ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම සංවිධානය හෝ එහි සේවකයින්ගෙන් කිසිවකු ශ්‍රී ලංකාවේදී බදු ගෙවිය යුතුව තිබේද;

(ii) එසේ නම්, ඔවුන් එම වගකීම ඉටු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0293/10

4.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2006 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව පෙන්වා දෙන පරිදි,

(i) මීටර් 9ක් දිග ලී කණු 21000ක් හා මීටර් 10ක් දිග ලී කණු 3400ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලද බවත්;

(ii) අවම මිල ගණන් ඉදිරිපත් කළ රාජ්‍ය දැව සංස්ථාවේ ටෙන්ඩරය පිළිනොගත් බවත්;

(ii) දෙවනුව අඩුම මිල ගණන් ඉදිරිපත් කළ දකුණු අප්‍රිකානු සමාගමට ටෙන්ඩරය ප්‍රදානය කළ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කෙසේ වෙතත් මීටර් 9ක් දිග ලී කණු 10500ක් හා මීටර් 10ක් දිග ලී කණු 1700ක් මිලදී ගත් බවත්;

(ii) එයින් දකුණු පළාතට සැපයූ කණු 2363කින් පාවිච්චියට ගෙන තිබුනේ කණු 73ක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) රාජ්‍ය දැව සංස්ථාවට ඉහත ටෙන්ඩරය ප්‍රදානය නොකිරීම නිසා රුපියල් මිලියන 79.5ක පාඩුවක් සිදු වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එකී පාඩුව පිළිබඳව වගකිවයුත්තන්ගේ නම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0366/'10

5.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතීන් අනුව වෛද්‍යවරුන් සහ ජනතාව අතර පැවතිය යුතු අවම අනුපාතය කුමක්ද;

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිගන්නා ප්‍රමිතීන් අනුව ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන් සහ ජනතාව අතර තිබිය යුතු අවම අනුපාතය කොපමණද;

(iii) දැනට ශ්‍රී ලංකාව තුළ පවතින වෛද්‍යවරුන් සහ ජනතාව අතර අනුපාතය කොපමණද;

(iv) මධ්‍යම රජයේ පාලනය යටතේ පවතින රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) පළාත් සභා යටතේ පවතින රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලින් පිටවන වෛද්‍යවරුන් රජයේ සේවයට බඳවා ගැනීම නතර කිරීමට හෝ සීමා කිරීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0411/'10

6.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් මහනුවර හන්තාන වත්තෙන් අක්කර 45 රූඩ් 02 පර්චස් 16 ක බිම් ප්‍රමාණයක් නීත්‍යානුකූල නොවන ඉඩම් හුවමාරුවක් ලෙස ෂාමිනී කිරිඇල්ල සහ පිලිප් ජයවර්ධන යන අය වෙත ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම ඉඩම ලබාදිය හැක්කේ ව්‍යවස්ථාපිතව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරාගෙන වුවත්, එම ක්‍රියා මාර්ගය අනුගමනය නොකර එවකට සිටි අමාත්‍යතුමා සහ ජ.න.ව.ස.ම සභාපතිතුමා විසින් එම ඉඩම පවරා ඇත්තේ නීත්‍යානුකූල නොවන ආකාරයකට බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) නීත්‍යානුකූලව පවරා නොමැති නම්, මෙම ඉඩම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට නැවත පවරා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) නීත්‍යානුකූල නොවන මෙම ඉඩම් ගණුදෙනුවට වගකිව යුත්තෝ කවුරුන්ද;

(iii) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0431/'10

7.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ කටයුතු අමාත්‍යවරයා සිය ධූරයේ රාජකාරි භාරගත් දිනයේ සිට අද දක්වා විදේශ කටයුතු අමාත්‍යවරයා ලෙස විදේශ ගතවූ වාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කළ රටේ නම, සංචාරය සඳහා හේතුව, අමාත්‍යවරයා සඳහා වියදම, කැටුව ගිය පුද්ගලයන්ගේ නම් සහ ඔවුන් වෙනුවෙන් දැරූ පිරිවැය, එක් එක් සංචාරය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් සංචාරය තුළින් මෙරට ලැබූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 5 තුළ, වත්මන් අමාත්‍යවරයාට පෙර එම තනතුර දැරූ පුද්ගලයන් ඉහත සඳහන් රටවලටම සංචාරය කළ වාර ගණන කොපමණද;

(ii) ඒ සඳහා වැයවූ සමස්ත පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0556/'10

8.

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009.02.20 දින ත්‍රස්තවාදී ගුවන් ප්‍රහාරයෙන් හානියට පත් වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ඇස්තමේන්තු අනුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු සිදුකරන ලද පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගේ නම්, කොන්ත්‍රාත් වටිනාකම හා ගෙවා ඇති මුදල් ප්‍රමාණයන් කවරේද;

(ii) ගොඩනැගිල්ලේ වර්ග අඩියක් සඳහා ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(iii) අලුත්වැඩියාවට අදාළ සියලු මුදල් ගෙවා අවසන් කර තිබේද;

(iv) අලුත්වැඩියා කටයුතු සඳහා ටෙන්ඩර් ප්‍රදානය කිරීමේදී නියමිත ටෙන්ඩර් පටිපාටි අනුගමනය කර තිබේද;

(v) එසේ නම්, ඊට අදාළ විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අලුත්වැඩියා කටයුතු ආරම්භ කළ දිනය කවරේද;

(ii) එම කටයුතු අවසන් කිරීමට ගිවිසුම්ගත කාලය කොපමණද;

(iii) මේ වන විට ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු මුළුමනින්ම අවසන් කර තිබේද;

(iv) ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සම්බන්ධයෙන් සෑහීමකට පත් විය හැකි බවට විශේෂඥ වාර්තාවක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0261/'10

9\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් වලස්මුල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0387/'10

10\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ 6 ක කාලය තුළ රෝහල්වලින් ඉවත් කළ බාල වර්ගයේ ඖෂධ ප්‍රමාණය කොපමණද;

(ii) එසේ ඉවත් කරන ලද ඖෂධවල වටිනාකම කොපමණද;

(iii) එම ඖෂධ ගෙන්වීමට අනුමතිය ලබා දී ඇත්තේ කවුරුන්ද;

(iv) එම ඖෂධ විනාශ කිරීමට රජය විසින් මුදලක් වැය කළේද;

(v) එසේ නම්, එම මුදල කොපමණද;

(vi) බාල වර්ගයේ ඖෂධ ගෙන්වීමෙන් සමස්තයක් ලෙස රජයට දැරීමට සිදු වූ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0432/'10

11\.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටක උද්ධමනය ගණනය කිරීමට බලය ලත් ආයතන කවරේද;

(ii) පසුගිය වර්ෂ 15ක කාලය තුළ එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය කොපමණද;

(iii) එක් එක් වර්ෂයේදී උද්ධමනය නිසා සිදුවන අගය අඩුවීම ගණන් බැලීමෙන් 1995 වර්ෂයේ රු.1000.00 ක අද වන විට මුදලේ තථ්‍ය වටිනාකම (1995 උපයන ලද රු. 1000.00 ක අද දින ක්‍රය ශක්තිය) කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රටේ ආර්ථිකය වගකීමෙන් තොරව මෙහෙයවීම වෙනුවෙන් වගකිවයුතු පුද්ගලයින්ගේ නම් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉන්දියාව, පාකිස්ථානය, මාලදිවයින, භූතානය, නේපාලය, සිංගප්පූරුව සහ මැලේසියාව වැනි රටවල උද්ධමනය පසුගිය වර්ෂ 5 සඳහා කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0557/'10

12.

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රස්තවාදී ගුවන් ප්‍රහාරයෙන් හානියට පත්වූ දේශීය ආදායම් ගොඩනැගිල්ල අලුත්වැඩියා කර අවසන් කරන තෙක් දෙපාර්තමේන්තුවේ අංශ ස්ථාපිත කිරීම සඳහා කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි කවරේද;

(ii) එම ගොඩනැගිලිවල අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එක් එක් කුලී ගොඩනැගිල්ලට ගෙවා ඇති මුළු මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒවායේ කුලී කාල සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ තවදුරටත් කුලී ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0262/'10

13.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් කටුවන කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් වල අධ්‍යාපනය ලබන දරු දැරියන්ගේ විභාග සමත් වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බැව් ඔබතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0433/'10

14.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල මේ වන විට ලියාපදිංචි වී ඇති ආගමික ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ඒවා අතුරෙන් වඩා වැදගත්කමින් යුතු වූද, ඓතිහාසික වටිනාකමින් යුක්ත වූද, ආගමික ස්ථාන 20 හි නම් කවරේද;

(iv) රජය විසින් එම ආගමික ආයතන වෙත වෙන් කර දී ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(v) එම ආයතනයන්හි වැඩ වසන පූජකවරුන් සංඛ්‍යාව එක් එක් ආගම අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0558/'10

15.

ගරු අජිත් කුමාර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

( අ) (i) අයිෆා සම්මාන උළෙල සඳහා සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනය නවීකරණය කරනු ලැබුවේද;

(ii) එසේ නවීකරණය කිරීමේදී ගෘහස්ත ක්‍රීඩාංගනය තුළ සිදු කළ වෙනස්කම් පිළිබඳ සම්පූර්ණ විස්තර කවරේද;

(iii) එම නවීකරණය කිරීම් සිදු කරනු ලැබූ ආයතනය කුමක්ද;

(iv) ඊට වැය කළ මුදල කොපමණද;

(v) එම මුදල් ප්‍රතිපාදන ලබා දුන් ආයතනය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනය තුළ,

(i) නවීකරණයට පෙර අසුන්ගත හැකිව තිබූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) නවීකරණයෙන් පසු අසුන්ගත හැකි පුදගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අධිකරණ අමාත්‍යතුමා,— පීඩාකාරී ආයුධ (සංශෝධන),— 1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

2.

අධිකරණ අමාත්‍යතුමා,— සමථ මණ්ඩල (සංශෝධන),— 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලාව අ.භා.1.00 සිට අ.භා.7.30 දක්වා විය යුතුය. අ.භා.7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

5.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ජෝන් සෙනෙවිරත්න පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2010 නොවැම්බර් මස 03 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*3.

භාණ්ඩාගාර ලේකම් (නියෝජිතයන් පත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*4.

සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*5.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*6.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග,— 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමග කියවිය යුතු 26 වැනි වගන්තිය යටතේ ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2010 ජූලි මස 12 දිනැති අංක 1662/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 ජූනි මස 17 දිනැති අංක 1658/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 අගෝස්තු මස 09 දිනැති අංක 1666/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 සැප්තැම්බර් මස 09 දිනැති අංක 1670/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2010 අගෝස්තු මස 30 දිනැති අංක 1669/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*12.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2010 ජූලි මස 09 දිනැති අංක 1661/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*13.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*14.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*15.

විසර්ජන පනත් කෙටුම්පත (2011) — දෙවැනි වර කියවීම

*16.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*17.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*18.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය,— 2002 අංක 17 දරන මැනුම් පනතේ 41 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සහා (වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර)" නියෝගයේ 3 වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2009 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1633 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*19.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*20.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 960,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*21.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඔෞෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*22.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*23.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*24.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*25.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*26.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**